2016 . 03 . 29

ද මැසිනොද් විදුහල කඳාන
De Mazenod College - Kandana

# ඉතිහාසය I

පළමු වාර පරීක්ෂණය 2016 — 10 ශ්‍රේණිය
විනාඩි 30

Learning Resource Center
R
De Mazenod College
Kandana

*සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.*

1. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම කෘතිය වන්නේ?
   I/ මහාවංශය II/ධාතුවංශය III/දීපවංශය IV/පූජාවලිය

2. මහාවංශයේ I කොටසේ කතුවරයාය.
   I/ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධ රක්ඛිත හිමි.
   II/ දික්සඳ සෙනවියා පරිවේනාධිපති මහනාමහිමි.
   III/ ධම්මකිත්ති හිමි
   IV/මහාවිහාරික බුද්ධඝෝෂ හිමිපාණෝ

3. ලංකාවට නොපැමිණි එහෙත් ලංකාව පිළිබඳ වාර්තා තැබුවෙකු වනුයේ? හෑව් ඉහේ ?
   I/ක්වේරෝස් පියතුමා II/ රිබෙයිරෝ III/ පිලිප්පස් බැල්ඩියස් IV/රොබට් නොක්ස්

4. ශ්‍රී ලංකා ඉතිහාසය පිළිබඳ ලියවී ඇති දකුණු ඉන්දියානු ග්‍රන්ථය කුමක්ද?
   I/ මණිමෙකලෛයි II/ යාල්පානවෛපවමලෙයි III/ පදිර්රුප්පත්තු
   IV/සිලිප්පාදිකාර

5. ඉතිහාසය පිළිබඳ නිවැරදි නිර්වචනයක් නොවනුයේ,
   I/ අතීත මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳ හදාරන විෂයකි.
   II/ එක් යුගයක් විසින් ලියා තැබූ තවත් යුගයකින් සොයාගත් ලේඛනයකි.
   III/ අතීතයේ සිට අනාගතය දක්වා ලියවී ඇති විෂය කොටසකි.
   IV/ සමාජ ක්‍රම වල මතක සටහනකි.

6. සාහිත්‍ය මූලාශ්‍ර පිළිබඳව සාවද්‍ය වේ
   I/ රටක විදේශ සබඳතා අධ්‍යනය
   II/ එක් එක් අවධිවල දේශපාලන,ආර්ථික,සමාජ තොරතුරු හෙළිවීම.
   III/ඓතිහාසික කාල අනුපිළිවෙල ලැබීම
   IV/මූලාශ්‍ර, සිද්ධීන් හා සමකාලීන වීම

7. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වන කාසි සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර වනුයේ,
   I/ ලංකාවේ කාසිභාවිතය පැමිණියේ පෘතුගීසි සමයේය.
   II/ පැරණිම කාසි 'කහාපණ' නම් වේ
   III/ලෝහ භාවිතය පිළිබඳ හෙළි කරන ප්‍රබලතම සාක්ෂියකි.
   IV/ කාසි පිළිබඳ හදාරන විෂය නාණක විද්‍යාව වේ.

8. සෙල්ලිපි වර්ගයක් නොවනුයේ.
   I/ ලෙන් ලිපි II/ තීරු ලිපි III/ ගිරිලිපි IV/ ආසන ලිපි

9. ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත්වූයේ,
   I/අවුරුදු එක් ලක්ෂ විසිදහසකට පමණ පෙරය.
   II/අවුරුදු එක් ලක්ෂ විසිපන්දහසකට පෙරය.
   III/ අවුරුදු එක් ලක්ෂ පනස්දහසකට පෙරය
   IV/ අවුරුදු දෙලක්ෂ පනස්දහසකට පෙරය

10. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය යන්නට ආසන්නම පිළිතුර වන්නේ,
    I./සාහිත්‍ය මූලාශ්‍ර මගින් විස්තර කෙරෙන අතීත කාලයේ ආරම්භයට පෙර යුගය.
    II/ මැටි වලං භාවිතා වූ යුගය.
    III/ ලෝහ භාවිතා වූ ගල් යුගයයි.
    IV/විජය කුමරුගේ ආගමනය සිදු වූ සමයේ සිට අනුරාධපුර රාජධානි සමය දක්වා යුගය.

11. ලංකාව ජනාවාස කරන ලද මානවයා වන්නේ,
I/ හොමෝ සේපියන් සේපියන් II/ හොමෝ නියන්ඩතාල් III/ හොමෝසාපියන් IV/ හොමෝඉරෙක්ටස්

12.ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ප්‍රධාන ස්ථාන 2කි,
I. සබරගමුව පළාතේ ඊසාන දිග කොටස හා ඌව පළාතේ නිරිතදිග කොටස
II. කොළඹගේආර රංචාමඩම විද්‍යාල භූමිය හා උඩරංචාමඩම ගම්මානය
III. ඉරණමඩු සැකැස්ම සහ රත්නපුරය ආශ්‍රිත මැණික් පතල් ය.
IV. ඌව පළාතේ හල්දුම්මුල්ල සහ බෙරගල

13.එළිමහන් කඳුකර වාසස්ථානයක් වන්නේ,
I/ පොතාන , අලිගල
II/ මිනිහාගල් කන්ද ,පතිරාජ වෙල
III/ බෙල්ලන්බැඳි පැලැස්ස , බුන්දල
IV/බණ්ඩාරවෙල , හෝර්ටන් තැන්න

14.ස්ථිරවාසී ජනාවාස යුගයේ පැවති වැව් ගම්මානයක් නොවන්නේ,
I/සුමනවාපිගාම II/ විහාරවාපිගාම III/ කඩහවාපීගාම IV/ නියම්ගාම

15. A හා B ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1පුර කමත | A.අමුණ |
| 2.නුරුපුර | B ප්‍රධාන වාස්තු ශිල්පියා |
| 3.ගහපති | C අනුරාධපුරය |
| 4.අවරණ | D ගෘහපති |

I/ BCDA II/ ABDC III/ CBAD IV/ DCBA

16. A හා B ගැළපා නිවැරදි පිළිතුර තෝරන්න

| | |
|---|---|
| 1කසීකාරගාම | A.ධීවරයින් විසූගම් |
| 2.වඩ්ඪකිගාම | B.ගොවියන් විසූගම් |
| 3.කේවට්ටගාම | C.වරාය ආශ්‍රිතව තිබුගම් |
| 4.පට්ටනගාම | D.වඩුවන් විසූගම් |

I/ DCAB II/ CBDA III/ BCAD IV/ BDAC

17. A හා B ගැළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1.පරුමක | A.නගර |
| 2.තොට බොජක | B.වත්පොහොසත්කම් ඇති ප්‍රභූන් |
| 3.ගමික | C.තීරුබදු අනුභව කරන්නා |
| 4.නකර | D.ගම් ප්‍රධානි |

I/ CBAD II/ DBCA III/ BCDA IV/ ACBD

18.පණ්ඩුකාභය රජතුමා පිළිබඳ කරුණක් නොවන්නේ,
I. මාමාවරුන් සමග සටන්කර රජකම අත් කර ගැනීම.
II.සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරා ගැනීම.
III.පංච කකුධ භාණ්ඩ භාවිතා කර අභිෂේක වීම.
IV.දසවන රාජ වර්ෂයේදී ග්‍රාම සීමා සටහන් කිරීම

**19.** රාජ්‍යත්ව සංකල්පයක් නොවන්නේ,
I/ බෝධිසත්ත්ව
II/ චක්‍රවර්ති
III/ දේවත්ව
IV රාජ්‍යත්ව

**20.** ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත කිරීමට සාධනීය පියවරක් තබනු ලැබුවේ,
I/කාශ්‍යප රජතුමා
II/ දුටුගැමුණු රජතුමා
III/සිත්නාරුබිම බුදල් නා
IV/ මුගලන් කුමරු

2016. 03. 29

ද මැසිනොද් විද්‍යාල කඳාන

De Mazenod College-Kandana

# ඉතිහාසය - II පත්‍රය

පළමු වාර විභාගය -2016 10 ශ්‍රේණිය කාලය පැය 02

Learning Resource Center R De Mazenod College Kandana

උපදෙස් : I කොටස අනිවාර්ය වේ.

II කොටසෙන් ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1 (අ) ශ්‍රී ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | |
|---|---|
| I/ ගෝකණ්ණතිත්ථ | VI/ පොම්පරිප්පුව |
| II/ මාතොට | VII/ ඉබ්බන්කටුව |
| III/ මල්වතුඔය | VIII/ බණ්ඩත්තර |
| IV/ මිනිගාගල්කන්ද | IX/ මහවැලි ගඟ |
| V/ අලි ගල | X/ කිරිඳි ඔය |

(ලකුණු 10)

(ආ) කෙටි පිළිතුරු සපයන්න.

I/සකස් කර ගත ගල්කුලුණු මත ලියූ ලිපි හඳුන්වන නම කුමක්ද?

II/ දසගම් ඇත්තන් යනු කවුරුන්ද?

III/ මෙරට ගල් යුගයේ තාක්ෂණය පිළිබඳව දැනුමක් ලබාදෙන කුඩා ප්‍රමාණයේ ගල් මෙවලම් හඳුන්වන නම කුමක්ද?


IV/මුල් ඓතිහාසික යුගයේ මෙරට ජනාවාස ව්‍යාප්තව පැවතියේ කුමන ප්‍රදේශවලදැ යි පෙන්නුම් කරන දර්ශකය කුමක්ද?

V/ මහා ශිලා සුසානයකට උදාහරණයක් ලියන්න.

(ලකුණු 5)

(ඇ) පහත සඳහන් A හා B රූප සටහන් ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A



I/ මෙම රූප සටහනේ දැක්වෙන නිර්මාණය කුමක්ද?


II/ මෙම නිර්මාණය කරවන ලද රජතුමා කවුද ?

III/ මෙය පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයකද?

IV/ මෙය කුමන අභිලේඛන වර්ගයට අයත්ද?

(ලකුණු 4)

B



I/ මෙම නිර්මාණය කුමක්ද ?

II/ මෙය පිහිටා ඇත්තේ කවර ස්ථානයකද ?

III/ මෙයින් නිරූපණය වන දෙවි වරුන් කවුද ?

IV/ මෙම මූර්තිකර්මයෙන් අපගේ සංස්කෘතික ඉතිහාසය පිළිබඳව හෙළිවන කරුණක් දක්වන්න.

(ලකුණු 4)

(ඇ) A,B,C,D,E,F,G වලින් අසා ඇති ප්‍රශ්න වලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

A - එදා හෙළදිව -

B- එල්ලංගාව -

C - බලය මධ්‍යගත වීම -

D - මහාවංස ටීකාව -

E - ප්‍රශස්ති කාව්‍යයකි -

F- බුද්ධඝෝෂ හිමි -

G - ලම්භකර්ණ වංශිකයෙකි -

(සමන්තපාසාදිකාව , මපුරුමුකා, රොබට් නොක්ස් , රට එක්සේසත් කිරීම , කුවේර , වැව් ප්‍රපතනය, පැරකුම්බා සිරිත , වංසත්ථප්පකාසිනී , වසභ රජු, භෞමික අඛණ්ඩතාව )

(ලකුණු 30)

II කොටස

කැමති ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

1. i. ඉතිහාසය විෂය අධ්‍යානයේදී සාහිත්‍ය මූලාශ්‍ර වලින් ඇති ප්‍රයෝජන 2ක් ලියන්න. (ලකුණු 2)

ii. ඉතිහාසය ගොඩ නැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් දක්වන්න. (ලකුණු 3)

iii. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විනාශ වන ආකාර 2 ක් සඳහන් කරන්න (ලකුණු 2)

2. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ වාසස්ථාන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

අ) වෙරළාශ්‍රිත එළිමහන් ස්ථානයක් -

ආ) තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් - (ලකුණු 2)

i.ප්‍රාග් ඓතිහාසික මානවයා සිය ජීවිකාව පවත්වාගෙන ගිය ආකාර දෙකක් ලියන්න. (ලකුණු 2 )

ii.ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 3)

3. i.පූර්ව ඓතිහාසික යුගය සංක්‍රාන්තික යුගයක් ලෙස හැඳින්වීමට හේතු සාධක 2ක් දක්වන්න. (ලකුණු 2)

ii.පූර්ව ඓතිහාසික යුගය නිරූපනය කරණ,

අ) මහා ශිලා සුසාන යනු ?
ආ) ශිලා මංජුසා සොහොන් යනු?

පැහැදිලි කරන්න. (ලකුණු 2)

iii.2009 වසරේදී සොයාගත් උඩරංචාමඩම නිවාස අවශේෂය ඇසුරින් ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසාගේ ආහාර රටාව, තාක්ෂණය, ජීවන රටාව විස්තර කරන්න. (ලකුණු 3)

4. i.මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වියළි දේශගුණයක් ඇති ප්‍රදේශ වල ව්‍යාප්ත වීමට හේතු 2 ක් ලියන්න. (ලකුණු 2)
ii.පරික්ඛිත ගම් හා අපරික්ඛිත ගම් යනු මොනවාදැ යි හඳුන්වන්න. (ලකුණු 2)

iii."ගහපති ,ගමික, පරුමකවරු යනු එකම දම්වැලක පුරුක් තුනකි." මෙම සම්බන්ධය විස්තරාත්මකව පහදන්න. (ලකුණු 3)

5. i. ගමිකයන් ඉටු කළ කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 2)

ii.ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය උරුම වූ ප්‍රධාන ආකාර දෙක කුමක්ද? (ලකුණු 2)

iii. මෙරට පාලනය කළ ශ්‍රේෂ්ට රජවරු තිදෙනෙක් පහත දැක්වේ. ඔබ කැමති එක් අයෙක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න. වචන 75ක් පමණ සෑහේ.

අ) දුටුගැමුණු රජතුමා
ආ) වසභ රජතුමා
ඇ) පළමුවන විජයබාහු රජතුමා (ලකුණු 3)

2016 . 03 . 29

Learning Resource Center
R
De Mazenod College
Kandana

